## කොළඹ විශ්වවිද්‍යාලය

## අධ්‍යාපන පීඨය

**පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) සිංහල හා ඉංග්‍රීසි මාධ්‍ය පාඨමාලාවල**

**පාසල් පුහුණුව අධීක්ෂණය සඳහා ප්‍රමුඛාචාර්ය තනතුරුවලට ගුරුවරුන් බඳවා ගැනීම**

උක්ත කාර්යය සඳහා ප්‍රමුඛාචාර්යවරුන් වශයෙන් බැඳීමට කැමති දැනට පාසල්වල ගුරු සේවයේ, ගුරු අධ්‍යාපනඥ සේවයේ හෝ ගුරු උපදේශක ලෙස සේවයේ නියුතුවූවන්ගෙන් **පහත සඳහන්** තොරතුරු ඇතුළත් අයදුම්පත් කැඳවනු ලැබේ.

(සම්පූර්ණ නම, රාජකාරී හා පෞද්ගලික ලිපිනය, උපන් දිනය, දුරකථන අංක හා වෘත්තීය සුදුසුකම්, උපාධිය, උපාධි විෂයයන්, විශ්වවිද්‍යාලය හා වර්ෂය, ලබා ඇති පශ්චාත් උපාධි, දනට දරන තනතුර, අධීක්ෂණය කටයුතු කිරීමට කැමති අධ්‍යාපන කොට්ඨාස/ය, අධීක්ෂණය කළ හැකි විෂයයන්, භාෂා මාධ්‍ය (සිංහල/ ඉංග්‍රීසි/ සිංහල හා ඉංග්‍රීසි), විදුහල්පති ලවා සහතික කළ ඔබගේ පෞද්ගලික කාලසටහන හෝ නිරත රාජකාරියේ ආයතන ප්‍රධානියා විසින් සහතික කළ ඔබගේ රාජකාරි කටයුතු පිළිබඳ විස්තරයක්)

**ඔබ පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.**

- **පිළිගත් විශ්වවිද්‍යාලයක** අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය හෝ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පරීක්ෂණයට අදාල ඉගැන්වීම් පුහුණු විෂයය සඳහා අවම වශයෙන් සම්මාන මට්ටමේ සාමාර්ථයක් සහිතව එකී පරීක්ෂණය සමත්වීම. (කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන ඩිප්ලෝමා/ අධ්‍යාපනවේදී උපාධි සඳහා ප්‍රමුඛත්වයක් ලැබේ.)
- එකී උපාධියෙන්/ ඩිප්ලෝමාවෙන් පසු අවම වශයෙන් වසර තුනක ඉගැන්වීම් පළපුරුද්ද ලබා තිබීම.

*මීන් පෙර ප්‍රමුඛාචාර්යවරයෙකු ලෙස සේවය කර තිබීම හා අධ්‍යාපනපති, අධ්‍යාපන දර්ශනපති හා අධ්‍යාපන දර්ශනශූරි උපාධිධාරියෙකුවීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.*

අයදුම්පත් 2016 ජූලි 18 දිනට හෝ ඊට පෙර ***"සම්බන්ධීකාරක, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සති අන්ත) පාඨමාලාව, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, කොළඹ 03"*** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවන්න. සියලු ම අයදුම්පත්‍ර සමඟ අදාළ අධ්‍යාපනවේදී උපාධි/ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා සහතිකයේ විස්තරාත්මක සහතිකයේ ඡායා පිටපතක් අමුණා එවන්න. අනෙකුත් සහතිකවල පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතුය. ලියුම් කවරයේ වම් කෙළවරේ ඉහළ "ප්‍රමුඛාචාර්ය තනතුරු සඳහා" යන්නද මාධ්‍ය සිංහල ද ඉංග්‍රීසි ද/ සිංහල හා ඉංග්‍රීසි ද යන්න සඳහන් කරන්න.

2016 වර්ෂයේ තුන්වන වාරයේ දී හා 2017 වර්ෂයේ පළමුවන වාරයේ දී ඔබ ඉල්ලුම් කරන ප්‍රදේශවල ගුරු සිසුන් හය දෙනෙකුගේ පමණ, ඔවුන් උගන්වන පාසල්වලට ගොස් ගුරු පුහුණු අධීක්ෂණ කටයුතුවල නිරතවීම අපේක්ෂා කෙරෙන අතර ඒ සඳහා අනුමත දීමනාවක් ගෙවනු ලැබේ. ප්‍රමුඛාචාර්යවරුන් තෝරා ගැනීමේ දී අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ද අදාළ විෂය පිළිබඳව ඇති ප්‍රවීණතාව ද උක්ත කාර්යය සඳහා පවතින ප්‍රාදේශීය අවශ්‍යතා ද ගැන සැලකිළිමත් වේ. එසේ තෝරා ගන්නා අය වෙත පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ.

**ලේඛකාධිකාරී**

**කොළඹ විශ්වවිද්‍යාලය,**

**කොළඹ** 03.

2016.06.23